# මිළිඳු පැණයෙන් පැනෙන නිබ්බානය

විසුද්ධාලොක අනුනාහිමි

බුඬ ධර්මයට ඇතුළත් බොහෝ ග්‍රන්ථයන්හි ඉතා දීර්ඝලෙස විස්තරවන නිබ්බාන පදය මිළිඳුපැනය ඇසුරින්ම විස්තර කළහොත් යථාර්ථය සපුරාලීම උගහට බැවින් ඉන් බැහැර වන්නට ද සිදු විය.

මිළිඳුපැනය බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථයන් අතර න්‍යාය හා තර්ක ශාස්ත්‍රය පදනම් කොට ඇති අගනා ග්‍රන්ථයකි. මේ ගණයේ අනික් ග්‍රන්ථය ලෙස සැළකිය හැක්කේ සහශ්‍ර සඞ්ඛ්‍යාත පරවාද ඛණ්ඩනය කළ කථාවත්ථුප්පකරණය යි, එය තෘතීය ධර්ම සංගීතියේ දී පෙළපොත් ගණයට ඇතුළත් කොට ඇත. මිළිඳු පැනය මුම්ම දේශයෙහි ඛුද්දක නිකායට ඇතුළත් කොට ඇති නමුත් ලක්දිව මිළිඳු පැනයට එ තැන නො ලැබෙ යි. සමහරවිට එසේ වීමට හේතුවී ඇත්තේ එහි මුල්ග්‍රන්ථය කථාවත්ථුව මෙන් මුල් අවදියේදි පෙළබසින්ම නොසැකසුන බැවින් හා බසින් බසට පරිවර්තනය කිරීමේ දී ඇති වී ඇති ප්‍රමාද ස්ථාන නිසායයි සැලකිය හැකිය.

එහෙත් අටුවා මහඇදුරු බුදුගොස් මාහිමිඳු මිළිඳුපැනය සිය අටුවා කථාවන්හි ද ගරුතන්හි තබා ඇත. (තෙනාහ: ආයස්මා නාගසෙනො[1]) අටුවාකථාව අනුරාධපුර මිහිඳු ගණයේ මහාවිහාරික භික්ෂූන් විසින් පිළිගන්නාලද බැවින් මිළිඳුපැනය ද ගෞරව ස්ථානීය ග්‍රන්ථයක් ලෙස ලක්වැසි භික්ෂූන්ගේ ප්‍රතිග්‍රහණය ගැණ ද නිශ්ශඞ්කිත ය.

නිරොධය: ‘‘භන්තෙ! නාගසෙන නිරොධො නිබ්බානන්ති? ආම මහාරාජ! නිරොධො නිබ්බානන්ති’’[2] නාසෙන් හිමියනි! නිබ්බානය නිරොධ ය ද? .මහරජ! එසේය. නිබ්බානය නිරොධය වේ ය යි වදළහ.

මහරජ! බාල පෘථග්ජනයෝ අධ්‍යාත්මික බාහිරායතනයන්හි ඇතිවන අරමුණු පිළිබඳව සතුටු වෙත්. ඒ අරමුණුවල වැද සිටිත්. ආරම්මණ ප්‍රවාහයෙහි ගැලෙත්. එහෙයින් ජාති ජරා මරණා දි දුකෙන් නො මිදෙත්. ආගමාධිගම සහිත ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම ඒ රූපාදි ආරම්මණයන්හි නො ඇලෙ යි. ඒ නො ඇලීමනිසා තණ්හාව ඇති නො වෙ යි. ඒ තණ්හා නිරොධයෙන් භව නිරොධය ද, භව නිරොධයෙන් ජාතිනිරොධය ද, ජාති නිරොධයෙන් ජරා මරණාදිදුක්ඛනිරොධය ද වෙ යි. මහරජ! මෙ සේ ඇතිවන නිරොධය නිබ්බානය වෙ යි.

‘‘කතමඤ්චාවුසො! දුක්ඛනිරොධං අරිය සච්චං? යො තස්සා යෙව තණ්හාය අසෙස විරාග නිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො’’[3] ඇවැත්නි! දුක්ඛ නිරොධාර්‍ය්‍ය සත්‍යනම් ඒ සමුදයාර්‍ය්‍ය සත්‍යයෙහි දක්වන ලද කාම - භව-විභව වශයෙන් ත්‍රිවිධ වූ තණ්හාව ගේ නිරවශෙෂ ප්‍රභාණය, දුරලීම, ත්‍යාගය, අත්හැරීම, නිදහස්වීම, ආලයරහිතවීම යි.

'රොධ' යනු වැලැක්වීම් අරුත්හි 'රුධ' දයින් කතු කරුහි නිපන් කෘදන්ත නාම පද යෙකි. එයින් 'වළක්වන්නා' යන අරුත පැවසෙයි. නිවන් මග වළක්වන්නා 'රොධ' නම් වූ තණ්හාවය. 'නි' යනු අභාවාර්ථය පවසන උපසර්ගයයි. ඒ වැළැක්වී ම හෝ බන්ධනය නැත්තේ නිරොධය හෙවත් නිවන යි.

නිබ්බානය: ''නිබ්බානං පන ලොකුත්තර සඞ්ඛාතං චතුමග්ග ඤාණෙන සච්ඡිකාතබ්බං මග්ග ඵලාන මාලම්බනභූතං වානසඞ්ඛාතාය තණ්හාය නික්ඛන්තත්තා නිබ්බානන්ති වුච්චති.''[4] නිවන වනාහි ලොව්තුරු සිවු මගනැණින් පිළිවිදියයුතු මගපලයන්ට අරමුණු වූ 'වාන' ය යි කියන ලද තණ්හා වෙන් නික්මුනු බැවින් 'නිබ්බාන' ය යි කියයි. මෙහි 'චතුමග්ගඤාණෙන සච්ඡි කාතබ්බං' යන්නෙන් සොතාපන්න - සකදගාමී - අනාගාමී - අරහන්ත යන ඒ ඒ ආර්‍ය්‍ය පුද්ගලයන්ගේ මාර්ග සම්ප්‍රයුක්ත ආර්‍ය්‍යඥාන චක්ෂුසින් දක්ක යුතු හෙයින් නිර්වාණයා ගේ ප්‍රත්‍යක්ෂ සිඬත්වය දර්ශිත ය. 'මග්ගඵලාන මාලම්බනභූතං' යන්නෙන් කල්‍යාණපෘථග්ජනයන්ට නිර්වාණය අනු- මාන සිඬයයි ද දර්ශිතය.[5] 'නිබ්බාන' යන්නෙන් ද ඒ 'නිරොධ' යන්නෙන් බිහි වන අරුතම පැවසෙ යි. ''වානං වුච්චති තණ්හා, නික්ඛන්තං වානතො, නත්ථි වා එත්ථ වානං ඉමස්මිං වා අධිගතෙ වානස්ස අභාවො'ති - නිබ්බානං''[6] වාන' නම් තණ්හාවයි. 'වාන' නම් වූ තණ්හාවෙන් නික්මුනේ හෝ, වාන සඞ්ඛ්‍යාත තණ්හාව මෙහි නැත්තේනු යි හෝ, නිවන් අවබෝධ කළ කල්හි වාන සඞ්ඛ්‍යාත තණ්හාවගේ අභාවය සිදුවේනු යි හෝ 'නිබ්බාන' නමි.

'ඛන්ධායතනාදි හෙදෙ තෙ භූමක ධම්මෙ හෙට්ඨු පරියවසෙන විනනතො, සංසිබ්බනතො වානං වුච්චති - තණ්හා, තාය නික්ඛන්තත්තා විසයාතික්කමන වසෙන අතීතත්තා නිබ්බානං''[7]

ස්කන්ධායතනාදි ප්‍රභෙද ඇති ත්‍රෛභූමක ධර්මයන් අධොර්ධ්ව වශයෙන් හිවී-ගෙතී- මැසී පවත්නා බැවින් තණ්හාවට 'වාන' ය යි කියනු ලැබේ. ඒ තණ්හාවෙන් නික්මුනු බැවින් හෝ තෘෂ්ණාවිෂයාතික්‍රම වශයෙන් ඉවත්ව ගිය බැවින් හෝ - නිබ්බාන නමි.

ගමනාර්ථ, බන්ධනාර්ධ යන්හි යෙදෙන 'වා' ධාතුවෙන් නිපන් 'වාන' ශබ්දය භව යෙන් භවය ගළපමින් මැස්මක් මෙන් එකින් එක සම්බන්ධ කරණ ගළපන බන්ධනය කරණ අර්ථයෙන් තණ්හාවට 'වාන' ය යි කිය යි. 'නි' උපසර්ගය නිෂ්ක්‍රාන්තාර්ථ යි. ඒ වාන සඞ්ඛ්‍යාත තණ්හා වෙන් නික්මුනු හෝ ඉවත්වුනු බැවින් 'නිබ්බාන' ය යි කිය යි. ජලයක හෝ මඩවැනි දෙයක හෝ වැටී තුබූ දෙයක් එයින් ඉවත් කරණ විට ජලය හෝ මඩ එහි වැකී පවතියි. එහෙත් මෙහි තණ්හාවෙන් ඉවත්වී මෙ හි දී කවර ලෙසකින්හෝ ඒ තණ්හාවෙහි පැවති බවක් නො දනෙන සේ සර්වප්‍රකාරයෙන් වෙන්වීම නිෂ්ක්‍රාන්තිය යි දතයුතු.

නිබ්බාන හෙද: ''තදෙතං සභාවතො එක විධම්පි, සඋපාදිසෙස නිබ්බානධාතු අනුපා දිසෙස නිබ්බාන ධාතුචෙ'ති දුවිධං හොති. කාරණ පරියායෙන.''[8] ඒ මේ නිර්වාණය ස්වකීය වූ ශාන්ත ලක්ෂණයෙන් එකවිධ වූයේ නමුදු කාරණව්‍යවහාරයෙන් ක්ලේශ වෘත්ත මාත්‍රයාගේ පරිනිර්වාණයට කාරණා වූ උපාදනස්කන්ධ ශෙෂය සහිතව පවත්නා හෙයින් සොපාදිශෙෂ නිර්වාණධාතු ය, ස්කන්ධශෙෂය ද නැතිකල උපාදිශෙෂ නැති හෙයින් අනුපාදිශෙෂ නිර්වාණධාතු ය යි ද්විප්‍රකාර වෙ යි.

''චතුහි උපාදනෙහි උපාදිය ති'ති = උපාදි. පඤ්චක්ඛන්ධ ස්සෙතං අධි වචනං, උපාදි එව සෙ සො කිලෙසෙහී'ති = උපාදි සෙසො. සහ උපාදිසෙසෙන වත්තතී'ති = සඋපාදි සෙසො. සා එව නිබ්බාන ධාතූ'ති = සඋපාදි සෙස නිබ්බානධාතු. නත්ථි

උපාදි සෙසො එතිස්සා'ති = අනුපාදි සෙසො සා එව නිබ්බාන ධාතූ'ති = අනුපාදිසෙස නිබ්බානධාතු''[9] චතුරොපාදනයන්ගෙන් දැඩි ලෙස ගණිනුයි = උපාදිනම්. මේ පඤ්චස් කන්ධයට නමකි. කෙලෙසුන්ගෙන් පස්කඳ සෙසු වූයේ උපාධිසෙස නම්. ඒ පස්කඳ ය යි කියන ලද උපාදිය සමග පැවැත්තේ= ස උපාදිසෙස නම්. එයම නිබ්බානධාතු නම්. එයම නිබ්බාන ධාතුව වූයේ ස උපාදිසෙස නිබ්බාන ධාතු නම්. මේ නිබ්බානධාතුවට උපාදිසෙසයක් නැත්තේ අනුපාදිසෙස නම්. එයම නිබ්බානධාතුව වූයේ අනුපාදිසෙස නිබ්බානධාතු නම්.

''දුවෙ ඉමා චක්ඛුමතා පකාසිතා-
නිබ්බාන ධාතු අනිස්සිතෙන තාදිනා,
එකාහි ධාතු ඉධ දිට්ඨ ධම්මිකා-
සඋපාදිසෙසා භවනෙත්ති සඞ්ඛයා-
අනුපාදි සෙ සා පන සම්පරායිකා
යම්හි නිරුජ්ඣන්ති භවානි සබ්බසො.[10]

තාදී ගුණ ඇති තෘෂ්ණා දෘෂ්ටි ආදි කෙලෙස් නැති කළ පසැස් ඇති භාග්‍යවත්හු විසින් නිබ්බානධාතු දෙකක් පවසන ලදහ. ඉන් භවමුලසිඳින සඋපාදි සෙසනම් දිටුදම්හි ඇතිවන එකෙකි. අනික සර්වප්‍රකාරයෙන් යම් තැනෙක්හි සියලුභවයෝ නිරුඬ වෙත් ද අනුපාදිසෙසනම් සම්පරායිකවූ එකෙක. මෙහි අනුපාදිසෙස නිබ්බානධාතුවෙන් පිරිනිවි පුද්ගලයෙකුට තමන් එසේ පිරිනිවි බව අන් කෙනෙකුට පළ කළ නො හැකි ය. ඒ පිරිනිවීම අනුපාදිසෙස නිබ්බාන ධාතුව බව පළ කළ හැක්කේ එසේ පිරිනිවීමෙන් පසු අනිකෙකුට ය. අනුපාදිසෙස නිබ්බානයෙන් පිරිනිවීමෙන් පසු පුද්ගලයෙක් හෝ ඒ පුද්ගලයාගෙන් පසු එබඳු නිවනක් හෝ නො ලැබෙන්නේ ය.

තවද,

''නිබ්බානං හි දුවිධං: අපච්චය පරිනිබ්බානං, අනුපාද පරිනිබ්බානන්''ති. තෙසු අවිජ්ජාදි පච්චය රහිතත්තා අසඞ්ඛත ධාතු අපච්චය පරිනිබ්බානං නාම. කිලෙස සඞ්ඛත පරිනිබ්බාන සඞ්ඛාතං උපාදානරහිතත්තා අරහත්තඵලං අනුපාද පරිනිබ්බානං නාම.''[11]

අපච්චය පරිනිබ්බානය, අනුපාදපරිනිබ්බාන ය යි නිබ්බානය දෙ පරිදිය. ඔවුනතුරෙන් අවිජ්ජාදි ප්‍රත්‍යය රහිත බැවින් අසඞ්ඛත ධාතුව අපච්චය පරිනිබ්බාන නම්. කිලෙස සඞ්ඛත පරිනිබ්බාන සඞ්ඛ්‍යාත උපාදන රහිත බැවින් රහත්ඵලය අනුපාද පරිනිබ්බාන නම්.

කාරණ පරියායයෙන් එසේ දෙපරිදිවූ නිබ්බාන ධාතුව: නැවත ආරම්මණ වසයෙන් ද රාග දෝස මෝහයන්ගෙන් ද ශූන්‍ය බැවින් සුඤ්ඤත ය. රාගාදි නිමිත්තරහිත බැවින් අනිමිත්ත ය. රාගාදි පණිධිරහිත බැවින් අප්පණිහිත ය යි ආකාර භෙදයෙන් තෙපරිදි වෙයි.[12]

පරිනිබ්බානය නිවීගිය ගින්නක් මෙනි: ''පරිනිබ්බුතො මහාරාජභගවා අනුපාදි සෙසාය නිබ්බානධාතුයා න සක්කා භගවා නිදස්සෙතුං ඉධ වා ඉධ වා'ති. ඔපම්මං කරොහී'ති තං කිං මඤ්ඤසි: මහාරාජ! මහතො අග්ගික්ඛන්ධස්ස ජලමානස්ස යා අච්චි අත්‍ථං ගතා සක්කා සා අච්චි දස්සෙතුං ඉධ වා ඉධ වා ති? නහි භන්තෙ, නිරුද්ධා සා අච්චි අපඤ්ඤත්තිංගතා''ති[13]

මහරජ! භාග්‍යවතුන් වහන්සේ අනුපාදිසෙස නිබ්බානධාතුවෙන් පිරිනිවී සේක. උන්වහන්සේ මේ මේ තැනක ය යි දක්විය නො හැකිය. උපමාවක් කරණු මැන. මහරජ! දැල්වෙන මහගිනිගොඩ නිවීගිය පසු, එහි තුබූ ගිනිදලු නැතිවී ගියහ. ඒ ගිනිදලු මේ මේ තැන ඇතැ යි දක්විය හැකි ද? එසේ නො දක්විය හැකි ය. ඒවා නො පෙනී ගියහ. මහරජ! එමෙන් භාග්‍යවතුන් වහන්සේ අනුපාදිසෙස නිබ්බානධාතුවෙන් පිරිනිවී සේක.

''ඛීණං පුරාණං නවංනත්ථි සම්භවං,
විරත්ත චිත්තා ආයතිකෙ භවස්මිං
තෙ ඛීණබීජා අවිරූළ්හිච්ඡන්දා,
නිබ්බන්ති ධීරා යථා'යංපදීපො''[14]

යම් කෙනෙකුන්ගේ පැරණි භවය ක්ෂයවී ද, වර්තමාන භවයක් ඇති නොවේ ද, යම් රහත් කෙනෙක් අනාගත භවයෙහි නො ඇලුනු සිත් ඇත්තාහු ද ඒ ධීරවත් ක්ෂීණාශ්‍රවයෝ ප්‍රතිසන්ධි බීජය නැති කළාහු නැවත ඉපදීමෙහි ආසාවක් නැත්තාහු මේ පහන නිවී ගියාක් මෙන් නිවීයත්.

ඉපදී මැරෙන අනාර්ය සත්වයන්ගේ අතීත කර්මය සම්බන්ධ තණ්හා නමැති තෙලය අප්‍රහීණ බැවින් ප්‍රතිසන්ධිය ඇතිවී උත්පත්තිය ක්ෂය නොවී සිටියි. යම් ආර්ය පුද්ගලයෙකුගේ ඒ අතීත කර්මය සම්බන්ධ තෘෂ්ණා තෙලය වියලී ගියේ නම් ගින් නෙන් දැවූ බීජයක් මෙන් නැවත ප්‍රතිසන්ධි විපාකයක් දීමට අසමත් බැවින් උත්පත්තිය ක්ෂය වී ය යි. ඒ ආර්යයන්ගේ බුඩපූජා ආදීන්ගේ වශයෙන් පවත්නා වර්තමාන කර්මයෝ වෙත් ද, ඒ කර්මයන්ගේ ද විපාක දීමේ පැවැති යම් කර්ම ශක්තියෙක් වේ ද එයද නැතිවී ය යි. ඒ ක්ෂීණාශ්‍රව භික්ෂූහු කම්ම - ඛෙත්ත - විඤ්ඤාණ - බීජ යන මොවුන්ගේ අභාවයෙන් ''ඛීණ බීජා'' නම් වෙත්. උන් වහන්සේලාගේ පුනර්භවය පිළිබඳ යම් ඡන්දයක් වී නම් එය සමුදය ප්‍රහාණයෙන් පහවී ගියේය. චරිම විඤ්ඤාණ නිරොධයෙන් පහන නිවීගියාක් මෙන් පිරිනිවියහ.[15]

නිබ්බානය අරූපය

**භන්තෙ නාගසෙන! නිබ්බානං නිබ්බානන්ති යං වදෙසි, සක්කාපන තස්ස නිබ්බානස්ස රූපං වා සණ්ඨානං වා වයං වා පමාණං වා ඔපම්මෙන වා කාරණෙන වා හෙතුනා වා නයෙන වා දස්සෙතුන්ති,**[16]

නාසෙන් හිමියනි! නිවන ය නිවන ය යි. යමක් ගැණ කියෙහිද? ඒ නිවනෙහි නීල පීතාදි රූපයක් හෝ සටහනක් හෝ වයසක් හෝ ප්‍රමාණයක් හෝ උපමාවකින් හෝ කාරණයකින් හෝ හේතුවකින් හෝ නය ක්‍රමයකින් හෝ දක්විය හැකිද? මහරජ! එසේ දක්විය නොහැකිය. මහරජ! ඔබට එක් කරුණකින් ඒ ගැණ කරුණු දක්වමි. මහරජ! මහමුහුද ගැණ විචාරන්නෙක් මහමුහුදෙහි කොතෙක් ජලය වෙයි ද? මත්ස්‍යාදි කොතෙක් සත්වයෝ වෙත් දැයි ද විචාළ හොත් එය නොවිචාළ යුතු ප්‍රශ්නයක් ලෙස සලකන්නේ ය.

මහරජ! විද්‍යමානවූ මුහුදු දියෙහි හා මුහුදු සතුන්ගේ ප්‍රමාණය සාමාන්‍ය පුද්ගලයෙකුට නො කිය හැකි වුවත් ඍද්ධිමත් පුද්ගලයෙකුට කියහැකි වෙ යි. එහෙත් නිවනෙහි සටහනක් හෝ ප්‍රමාණයක් හෝ ඍද්ධිමතෙකුට වුවත් නො කිය හැකිය. මහරජ! විද්‍යමානවූ ද ඒකාන්ත සැපවත්වූ ද නිවනෙහි රූසටහණක් හෝ ආකාරයෙක් හෝ කිසිවෙකුට කිය නො හැකි ය.

නිවනෙහි ඇති ගුණ: නාසෙන් හිමියනි! නිවනෙහි දක්විය හැකි රූ සටහණක් නැත්නම් උපමා වශයෙන් දක්විය හැකි යම් කිසි ගුණයෝ වෙත් ද?[17]

මහරජ! නිවනෙහි ස්වරූප වශයෙන් කිය යුතු ගුණයක් නැත. එහෙත් උපමාවෙන් පැහැදිලි කළ හැකි ගුණ අතුරෙන්: පියුමෙහි ඇති එක ගුණයක්ද, දියෙහි ඇති දෙගුණයක්ද, අගදයෙහි තුන් ගුණයක් ද, සමුද්‍රයෙහි සිවු ගුණයක් ද, භොජනයෙහි පස් ගුණයක් ද, අහසෙහි දසගුණයක් ද, මැණිකෙහි තුන් ගුණයක් ද, රත්සඳුනෙහි තුන් ගුණයක් ද, ගිතෙල් මඩෙහි තුන් ගුණයක් ද, කඳු මුදුනෙහි පස් ගුණයක් ද උපමා වශයෙන් දක්විය හැක්කාහු වෙති.

මහරජ! පත්මය ජලයෙහි හැදී වැඩුන නමුත් ජලයෙන් මතුවී ජලයෙහි නො ඇලී පවති යි. එමෙන් නිවන සත්ව ලෝකයෙහි ඇති වන නමුත් සියලු ක්ලෙශයන්හි නො ඇලී මතුවී සිටියි.

**නිවන ඇතිවී පවතින්නක් නො වේ:** නාසෙන් හිමියනි! නිවන අතීතානාගත ප්‍රත්‍යොත්පන්නත් නො වේ. උපන්නකුත් නොවේ. නුපන්නකුත් නො වේ. උපදවන ලද්දකුත් නො වේ ය යි කියයි.[18]

මහරජ! කිසිවෙක් මනාව පිළිපන්නේ නිවන් පසක් කරයි ද, හෙතෙම උපන් නිවනක් පසක් නොකර යි. නිවනක් උපදවා පසක් නො කර යි. එහෙත් මහරජ! මනා පිළිවෙතින් පසක් කරණ නිවනක් ඇත. එය බුදුදහමට අනුව මනාව පිළිපන් පුද්ගල තෙම සංස්කාරයන් ප්‍රත්‍යක්ෂ කොට නුවණින් අවබෝධ කර යි. මහරජ! අතැවැසියෙක් ඇදුරු දෙසුමට අනුව පිළිපැද නුවණින් විද්‍යාව ප්‍රත්‍යක්ෂ කරයි ද, එමෙන් බුදුදහමට අනුව පිළිපැද නිවන් පසක් කර යි.

නිවන කෙසේ පසක් කරයිද? මහරජ! මහ ගිනි රැසින් තැවුනෙක් එයින් ඉවතට ගොස් සිහිල් ගුණයෙන් සැනසෙයි ද, එමෙන් ත්‍රිවිධාග්නි සන්තාපයෙන් තැවු නෙක් උතුම් නිවන ප්‍රත්‍යක්ෂ කරයි. නාසෙන් හිමියනි! මනාව පිළිපන්නෙක් කෙසේ නිවන ප්‍රත්‍යක්ෂ කරයි ද? මහරජ! මනාව පිළිපන්නෙක් සංස්කාරයන්ගේ පැවැත්මෙන් ඇති වන ජාති ජරා මරණයන් දැක ඔවුන්ගේ ගතයුතු දෙයක් නො දකී ද, දවසක් මුළුල්ලේ ගින්නෙන් රත්වූ යගුළියක රත් නොවූ තැනක් නැද්ද, එමෙන් ජාත්‍යාදි සසර දුකෙන් පෙළෙන සකර දහමුන් කෙරෙහි කළකිරී එයින් නිදහස් වීමට විදසුන් වඩා නිවන් ප්‍රත්‍යක්ෂ කරයි.

**නිවන පිහිටි දිසාවක් හෝ නැත:** මහරජ! නිවන පිහිටි දිසාවක් හෝ නැත. මහරජ! ගින්නක් ඇත. ඒ ගින්න අසවල් තැන ඇතැ යි කියයුතු තැනක් නැත. ගිනිගානා දඬු දෙකක් එකට ගටා ගිනි උපදව යි. කිසියම් තැනකින් එතැනට ගිනි නො එ යි. ඒ දඬු තුළින්ම ගින්නක් මතුවෙයි. එමෙන් විදසුන් වඩන්නහු තුළින්ම නිවන් මතු වෙ යි.

**නිවන් ලොවක් - පුරයක් - මැදුරක් නැත:** බඹ ලොවක් දෙව් ලොවක් මෙන් නිවන් ලොවක් නැත. දෙව් පුරයක් වැනි නිවන් පුරයක් හෝ නැත. දෙව් මැදුරක් වැනි නිවන් මැදුරකුත් නැත. බුදු සමයෙන් බැහැර සමයවාදීන්ගේ සදකාලික ආත්මයක් හට සැප විඳින ලෝකයක් ස්වර්ගයක් ඇත යන ව්‍යවහාරය මත නිවන් පුරය[19] ආදි ව්‍යවහාර පැවැති බව පෙනෙයි. ඇතැම් තැනෙක ධර්ම නගරයක් දක්වන්නාක් මෙනි.[20]

1. වි: ම: 327 පිට. සං. අ. 2 කා. 20. පි.
2. මි. 64. පි.
3. සච්ච විභඞ්ග සුත්ත.
4. අ-ස. 193. පි.
5. අ-ස. 194. පි.
6. ඉ-අ. 131. පි.
7. අ-ස. 194. පි.
8. අ-ස. 194. පි.
9. අ-ස. 194. පි.
10. ඉ-පා. 146. පි.
11. මි-ටී. 378 පි.
12. අ-ස. 194 පි
13. මි. 69 පි.
14. රතනසුත්ත 14 ගා.
15. සු-අ. 224 පි.
16. මි. 275 පි.
17. මි. 277 පි.
18. මි. 281 පි.
19. මි. 288 පි.
20. ''ද්වාරංවාපනනිබ්බාණ නගරස්ස පවෙසනෙ'' වි-ම. 8 පි.

සංකේත නිරූපනා:-

මි. පාළිමිළින්ද පඤ්හය (බ. ආනන්ද මෛත්‍රෙය මහ නා හිමි)
මි: ටී: පාළිමිළින්ද පඤ්හටීකා
අ: ස: අභිධම්මත්ථ සංග්‍රහ සන්නය
ඉ: පාළි: ඉතිවුත්තක පාළි
ඉ: අ: ඉතිවුත්තක අට්ඨකථා
සු: අ: සුත්තනිපාතට්ඨ කථා